# තනතුරු ඇබෑර්තු

# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙරට බහුවිධ යටිතල පහසුකම් නියාමන ආයතනය වශයෙන් ස්ථාපිත කර ඇත. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සම්මත කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂණ හා තාක්ෂණ නියාමන ආයතනය වශයෙන් ක්‍රියාත්මක වේ.

**පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත වෘත්තිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## (01) සහකාර අධ්‍යක්ෂ - ආයතනික සන්නිවේදන (තොරතුරු කළමනාකරණ)

### තනතුරු 01 කොන්ත්‍රාත් පදනම මත අවුරුදු 01ක් සඳහා

(අ) වාර්තා කිරීමේ සම්බන්ධතාවය

අධ්‍යක්ෂ- ආයතනික සන්නිවේදන

(ආ) සුදුසුකම්

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ප්‍රථම උපාධිය හෝ ඒ සමාන සුදුසුකම්

(ඇ) ප්‍රධාන වගකීම්

බහුවිධ නියාමන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට අදාළ වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත සහ ශ්‍රී ලංකා විදුලිබල පනත සහ අනෙකුත් පනත් (අනාගතයේ දී බලාත්මකවනු ලබන පනත් ද ඇතුළුව) යටතේ සැපයිය යුතු තොරතුරු සඳහා කාර්යක්ෂම හා ඵලදායී පද්ධතියක් පවත්වාගෙන යාම, සියලු පාර්ශවකරුවන්ට සැපයිය යුතු ප්‍රගාමී තොරතුරු සඳහා වගකිව යුතු වේ. තොරතුරු පනත යටතේ තොරතුරු ලබාදීමේ කටයුතු සඳහා ද වගකීම පැවරේ.

(ඈ) පළපුරුද්ද

- දත්ත හා තොරතුරු එක්රැස් කර පවත්වාගෙන යාමේ දක්ෂතාවය.
- වාර්තා ලිවීමේ හා ඉදිරිපත් කිරීමේ පළපුරුද්ද
- මහජන සම්බන්ධතා හා අංග කළමනාකරණ පළපුරුද්ද
- ඉංග්‍රීසි හා සිංහල යන භාෂාවල ප්‍රවීනතාවය
- නියාමන කටයුතු පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

(ඉ) වයස

අවුරුදු 35ට වඩා අඩු විය යුතු ය.

## (2) කළමනාකරණ සහකාර (තනතුරු සංඛ්‍යාව 01)

(අ) වාර්තා කිරීමේ සම්බන්ධතාවය

අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු

(ආ) සුදුසුකම්

- අ.පො.ස. උසස් පෙළ එක් වාරයකදී විෂයයන් 3ක් සමත් වීම (සාමාන්‍ය දැනුම හා පොදු ඉංග්‍රීසි යන විෂයයන් හැරුණු විට) **සහ**
- අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි, සිංහල/දෙමළ භාෂාවන් සහ ගණිතය විෂයයන්ට සම්මාන සහිතව එක් වරකදී විෂයන් 6 ක් සමත් වී තිබීම

(ඇ) අවශ්‍ය පළපුරුද්ද සහ නිපුණතා

- දත්ත විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද
- සන්නිවේදන හැකියාව
- විදුලිබල කර්මාන්තයේ හෝ නියාමන ආයතනයක පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

(ඈ) වයස

- අවුරුදු 18ත් 30ත් අතර වීම

ඉහත තනතුරු සඳහා ආකර්ෂණීය වැටුප් හා ප්‍රතිලාභ හිමි වේ. සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන හැකියාවන් මත පදනම් ව තෝරාගැනීම සිදු වේ.

අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංක, උපන් දිනය, වයස, පුරවැසිභාවය, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ වෙනත් තොරතුරු සහ අයදුම්කරු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක ඇතුළත් කරන ලද, අයදුම්පත් 21.08.2020 වැනි දින හෝ එදිනට පෙර එවිය යුතු වේ. අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කොටසේ හෝ ඊමේල් පණිවිඩයේ විෂය තීරයෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**සභාපති**

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**

**6 වන මහළ, ලංකා බැංකු වෙළඳ කුළුන, 28, ශාන්ත මයිකල් පාර, කොළඹ - 03.**

**දුරකතනය: 011-2392608/7 ෆැක්ස්: 011-2392641**

**ඊමේල්: careers@pucsl.gov.lk වෙබ් අඩවිය: www.pucsl.gov.lk**

**2020.08.07**

Source: Dinamina, Daily News (2020.08.07)